# සිරිලකින් බිහිවන

## අනාගත ශේක්ස්පියර්ලා හා තාගෝර්ලා



ශ්‍රී ලංකාව දක්ෂයන් අතරින් අති දක්ෂයන් බිහි වන රටකි. එවන් අති දක්ෂයින් විසි හතර දෙනකු මට පසුගියදා හමුවිය.මෙයින් විසි දෙ දෙනෙකු රචනා කල පොත් 22ක් පසුගිය සැප්තැම්බර් 15 වනදා මාතර හිත්තැටිය රජ මහා විහාරස්ථාන යේදී දොරට වැඩිණ .දොරට වැඩීමේ උත්සවය මෙහෙයවූ අතිදක්ෂ ළමා නිවේදිකාව උත්සවය වර්ණවත් අයුරින් මෙහෙයවූ අතර ගීත හා නැටුම් සං දර්ශන වලින්ද අලංකාර විය.

මෙම පොත්පත් මුද්‍රණය හා උත්සව කටයුතු සඳහා සම්පූර්ණ බරපැන හා මෙහෙයවීම පන්නිපිටිය මාලපල්ලේ "නිර්මාණී ලේඛක පුබුදුව හා සමාජ සංවර්ධන සංසදය" මගිනි. පසුගිය වසර 5ක් පුරා ලංකාවේ සෑම ප්‍රදේශ යකම දරුවන් ලියුපොත් මුද්‍රණය කොට එම දරුවන් ධෛර්යමත් කිරීම ඉතා අගය කළ යුතුය.දරුවෙකුගේ පොතක් මුද්‍රණය කර දීමට ඔබත් දායක වන්නේ නම් එම දරුවාගේ කුසලතා වර්ධනය සඳහා ඔබ කරන ගරු කටයුතු මහඟු සේවයකි.එමෙන්ම ඕස්ට්‍රේලියාවේ වෙසෙන ලාංකික දරුවෙ කුගේ පොත් ද මෙම සංසදයට එවිය හැකිය. ප්‍රධාන අනුශාසකත්වය දරන්නේ ශාස්ත්‍රපති පූජ්‍ය අග්‍රහැර කස්සප හිමියන් වන අතර උපදේශක වරු ලෙස මහාචාර්ය ජේ බී දිසානායක, ප්‍රවීණ ගත්කතුවර දෙනගම සිරිවර්ධන, තිලකරත්න කුරුවිට බණ්ඩාර, උදයා දේවමුල්ල,විමල් දිසානායක, ලංකා ජයවර්ධන, ආචාර්ය ජානකී ගලප්පත්ති,සමන්ත යන මහත්ම මහත්මීහු කටයුතු කරති.මේ සම්බන්ධ වැඩි තොරතුරු ප්‍රධාන ලේකම් ලංකා පෙරේරා මහත්මියගෙන් ලබාගත හැක

ඇගේ දුරකථන අංකය

**+94 71 805 2942.**

ප්‍රවීණ මාධ්‍යවේදී ගත්කතුවර දෙනගම සිරිවර්ධනයන් මෙහිදී හරවත් දේශනයක් පැවැත්වූහ.

